# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2172/6 - 2020 අප්‍රේල් මස 22 වැනි බදාදා - 2020.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

**රේගු ආඥාපනත (235 වැනි අධිකාරය)**

10 (අ) වැනි වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගය

1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය) වන රේගු ආඥාපනතේ 10 (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත උපලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් වරණීය හා සාමාන්‍ය තීරු බද්ද මත, එම උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන්ගෙන් අධිභාරයක් 2020 අප්‍රේල් මස 23 වැනි දින සිට මාස 02ක කාලසීමාවක් බලපවත්වන පරිදි මෙම නියමය මගින් පනවමි.

1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය) වන රේගු ආඥාපනතේ 10 (අ) වගන්තිය යටතේ පනවන ලද 2020.03.13 දිනැති අංක 2166/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත අදළ නියමය 2020 අප්‍රේල් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| *ශීර්ෂ අංකය* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *විස්තරය* | *තීරු බද්ද මත අයකළ යුතු අධිභාරය* |
| **27.10** | | --- | **පැට්‍රෝල්** | |
| | 2710.12.21 | --- | ඔක්ටේන් අංක 92 සහිත පැට්‍රෝල් | ලීටරයට රු. 26 |
| | 2710.12.22 | ---- | ඔක්ටේන් අංක 95 සහිත පැට්‍රෝල් | ලීටරයට රු. 49 |
| | 2710.12.29 | ---- | අනෙකුත් | ලීටරයට රු. 49 |
| | | --- | **ගෑස් ඔයිල්/ඩීසල්** | |
| | 2710.19.41 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් | ලීටරයට රු. 40 |
| | 2710.19.42 | ---- | කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට වැඩි නමුත් කිලෝග්‍රෑම් 1කට මිලි ග්‍රෑම් (මිලියන එකකට කොටස්) 500ට නොවැඩි ගෙන්දගම් අඩංගු අනෙකුත් ඩීසල් වර්ග | ලීටරයට රු. 24 |
| | 2710.19.49 | ---- | අනෙකුත් | ලීටරයට රු. 40 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.